**AIA Insurance Lanka PLC** (Co. No. PQ 18)

Head Office
P O Box 2088
75, Kumaran Ratnam Road,
Colombo 2, Sri Lanka
T : (+94 11) 231 0310
F : (+94 11) 244 7620
E : lk.info@aia.com

AIALIFE.COM.LK

# Media Release

## AIA ශ්‍රී ලංකා වසර 2014 දී විශිෂ්ට ප්‍රගතියක් අත්පත් කර ගනී

AIA ඉන්ෂුවරන්ස් ලංකා පීඑල්සී (''ශ්‍රී ලංකා'' හෝ ''සමාගම'') හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින්, 2014 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර තුළ සමාගම සහ එහි පරිපාලිතයන් හි මූල්‍යමය ප්‍රතිඵල මෙසේ ප්‍රකාශයට පත් කරනු ලබන්නේ ඉමහත් සතුටිනි.

එහිදී අත්පත් කරගන්නා ලද සුවිශේෂී ප්‍රතිඵල මෙසේය ඃ

**පැහැදිලි ක්‍රමෝපායික ප්‍රමුඛතාවන් ක්‍රියාවේ යෙදවීම ඔස්සේ තිරසාර වර්ධනයක්**

* 2013 දී වාර්තා වූ රුපියල් මිලියන 9,536ට සාපේක්ෂව දළ වාරික ආදායම රුපියල් මිලියන 10,213 දක්වා සියයට 7.1කින් වර්ධනය විය.

* සාමාන්‍ය කොටස් හි කරන ලද ආයෝජනයන්ගේ වෙළඳපළ වටිනාකම වැඩිවීම නිසා උපලබ්ධි නොවූ ලාභද ඇතුළත්ව සමස්ථ ආයෝජන ආදායම රුපියල් මිලියන 4,707 දක්වා සියයට 6.8 කින් වර්ධනය විය.

* ජීවිත රක්ෂණ දළ වාරික ආදායම රුපියල් මිලියන 7,267 දක්වා සියයට 5.9 කින් වර්ධනය විය

* සාමාන්‍ය රක්ෂණ දළ වාරික රුපියල් මිලියන 2,946 දක්වා සියයට 10 කින් වර්ධනය විය.

**විශිෂ්ට ප්‍රගතියක් සමගින් දිවයින පුරා මෙහෙයුම් ව්‍යාප්තියට සැලකිය යුතු ආයෝජනයක්**

* ඒකාබද්ධ බදු වලට පසු ලාභය රුපියල් මිලියන 352ක් වූ අතර දිගුකාලීන තිරසාර වර්ධනය උදෙසා ශාඛා ජාලය පුළුල් කිරීම වෙනුවෙන් සිදුකරන ලද සැලකිය යුතු

ආයෝජනය සහ වෙළඳපළ පොලී අනුපාත පහළයාම හේතුවෙන් වූ ආයෝජන ආදායමෙහි අඩුවීම මේ සඳහා හේතු සාධක විය.

* රුපියල් මිලියන 100ක ජීවිත රක්ෂණ අරමුදල අතිරික්තයක් ප්‍රකාශයට පත් කළේය.

**2014 වසරේ ප්‍රතිඵල සම්බන්ධයෙන් AIA ශ්‍රී ලංකාහි ප්‍රධාන විධායක නිලධාරී ෂා රුෆ් මෙසේ පැවසීය**

''වසර 2014 දී අපි ක්‍රමෝපායික ප්‍රමුඛතාවන් ක්‍රියාවට නැංවීම ඔස්සේ උසස් තත්ත්වයේ වර්ධනයක් අත්පත් කරගැනීම කෙරෙහි වූ අපගේ අවධානය අඛණ්ඩවම යොමු කළා. වසර තුළදී අපගේ ශාඛා ජාලය 123 ක් දක්වාද වෙල්ත් ප්ලෑනර්වරුන් සංඛ්‍යාව 5,000කට අධික මට්ටමකට ගෙන එමින්ද සාර්ථකව ශ්‍රී ලංකාව පුරා අපගේ ව්‍යාප්තිය සනිටුහන් කළා. සේවාලාභීන් වෙත නිරතුරුවම අපගේ ප්‍රමුඛතාවය හිමි වන අතර ව්‍යාපාරික මෙහෙයුම් පුළුල් කිරීම සඳහා සිදුකරන ලද ආයෝජන ඔස්සේ සේවාලාභීන්ගේ කැපී පෙනෙන එමෙන්ම දිනෙන් දින වර්ධනය වන අවශ්‍යතාවන් වඩාත් හොඳින් හඳුනාගනිමින්, ඔවුන් වෙත ප්‍රශස්ත මට්ටමේ සේවා අත්දැකීමක් ලබාදීමට හැකි වනු ඇතැයි මා විශ්වාස කරනවා.''

''ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන් ව්‍යාපාරික වශයෙන් වියුක්තව පවත්වා ගෙන යාම සම්බන්ධ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය මගින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කළ පුරෝගාමී සමාගමක් බවට AIA ශ්‍රී ලංකා පත් වූ අතර, එය රක්ෂණ ක්ෂේත්‍රයෙහි අභිවෘද්ධිය සඳහා ඉවහල් වන ඵලදායක පියවරක් වනු ඇති බව අපගේ විශ්වාසයයි.'' යනුවෙන් හෙතෙම තවදුරටත් පැවසීය.

**ශ්‍රී ලංකාහි සභාපති ගෝඩ්න් වොට්සන් මේ පිළිබඳව මෙසේ සිය අදහස් පළ කලේය ඃ**

'' වසර 2014දී AIA ඉන්ෂුවරන්ස් මගින් ඉහළ කාර්යසාධනයක් අත්පත් කරගැනීම පිළිබඳව මා අතිශය සතුටට පත් වන අතර එහිදී අනාගත තිරසාර වර්ධනයන්හි පදනම සැකසීම උදෙසා සිදුකරන ලද ආයෝජනයන් අතිශය වැදගත් වෙනවා. "සැබෑ ජීවිතය හඳුනන ඔබේ රක්ෂණ සමාගම" වශයෙන් වන AIA හි වෙළඳනාම ප්‍රතිඥාව ඔස්සේ සේවාලාභීන් වෙත මූල්‍යමය සේවාවන් ලබාදීම සහ සැබෑ ජීවිතයේ විවිධ වූ අවස්ථාවන් සහ අභියෝගයන් වෙත මුහුණදීම සඳහා ඔවුන් සූදානම් කිරීම උදෙසා වන අපගේ නොමඳ කැපවීම මැනවින් විදහා දක්වෙනවා. අපගේ සාර්ථකත්වය ගොඩනැගී ඇත්තේ තිරසාර සේවා සබඳතා සහ තිරසාර ව්‍යාපාරික ක්‍රියාකාරකම් මත බව පැවසිය යුතුයි. අපගේ සේවාලාභීන් හට වඩාත්ම වැදගත් දේ සුරැකීම සඳහා අප ඇපකැප වී කටයුතු කරන අතරතුර ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක සමාජ හා ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය වෙත සක්‍රීය දායකත්වයක් ලබාදීමටද අප ක්‍රියා කරනවා.''

සමාප්තයි.

## AIA ශ්‍රී ලංකා පිළිබඳව

2012 දෙසැම්බර් මස AIA සමූහය මගින් මේ වන විට AIA ඉන්ෂුවරන්ස් ලංකා පීඑල්සී නමින් හැඳින්වෙන ව්‍යාපාරයෙහි අත්පත් කරගැනීම සම්පූර්ණ කරමින් ශ්‍රී ලංකාව වෙත සිය ආගමනය සනිටුහන් කරන ලදී.

## AIA පිළිබඳව

සීමාසහිත AIA සමූහය සහ එහි පරිපාලිතයන් මගින් (සාමූහිකව '' AIA ''හෝ ''සමූහය'') විශාලතම ස්වාධීන මහජන ලැයිස්තුගත ආසියානු ජීවිත රක්ෂණ සමූහය නිර්මාණය කෙරේ එමගින් හොංකොං, තායිලන්තය, සිංගප්පූරුව, මැලේසියාව, චීනය, කොරියාව, පිලිපීනය, ඕස්ට්‍රේලියාව, ඉන්දුනීසියාව, තායිවානය, වියෙට්නාමය, නවසීලන්තය, මැකාවු, බෲනායි යන රටවල පූර්ණ හිමිකාරීත්වය සහිත පරිපාලිතයන් ඔස්සේද ශ්‍රී ලංකාවේ සියයට 97ක පරිපාලිතයක් ඔස්සේද ඉන්දියාවේ සියයට 26ක හවුල් ව්‍යාපාරයක් මගින්ද මියැන්මාරයේ නියෝජිත කාර්යාලයක් ඔස්සේද ව්‍යාපාරික මෙහෙයුම් සිදුකෙරේ.

මේ වන විට AIA නමින් ස්ථාපිත ව්‍යාපාරය මෙයට වසර 90කට පෙරාතුව ෂැංග්හයි හිදී බිහි කෙරිණි. එය ජීවිත රක්ෂණ වාරික අනුව සළකන කල ආසියා ශාන්තිකර කළාපයෙහි (ජපානය හැර) වෙළඳපළ ප්‍රමුඛයා වන අතර එමගින් සිය වෙළඳපළ බහුතරයක ප්‍රමුඛස්ථානයන් හොබවනු ලැබේ 2014 නොවැම්බර් මස 30 වැනි දිනට එහි සමස්ත වත්කම් ඇමරිකානු ඩොලර් බිලියන 167 ක් විය.

AIA මගින් ජීවිත රක්ෂණ, හදිසි අනතුරු සහ සෞඛ්‍ය රක්ෂණ සහ ඉතුරුම් සැලසුම් රැසක් ඉදිරිපත් කරමින් සේවාලාභීන්ගේ දිගු කාලීන ඉතුරුම් සහ රැකවරණ අවශ්‍යතා සපුරාලනු ලැබේ. සමූහය මගින් ආයතනික සේවාලාභීන් සඳහා සේවක ප්‍රතිලාභ, ණය ජීවිත රක්ෂණ සහ විශ්‍රාම සැලසුම් ද සපයනු ලැබේ. ආසියා ශාන්තිකර කළාපය පුරා විසිරුනු පුළුල් නියෝජිත ජාලයක් ඔස්සේ AIA, මිලියන 28කට අධික පුද්ගල ජීවිත රක්ෂණවර සහ සමූහ රක්ෂණ සැලසුම් යටතේ මිලියන 16කට අධික සහභාගීත්ව සාමාජිකයින් වෙත සේවය සලසයි.

සීමාසහිත AIA සමූහය ඇමරිකන් ඩිපොසිටරි රිසිප්ට්ස් (මට්ටම 1) සමගින් කොටස් කාණ්ඩ අංක ''1299''යටතේ හොං කොං කොටස් වෙළඳපළෙහි ප්‍රධාන පුවරුවෙහි ලැයිස්තුගත කොට ඇත

.

**Media Enquiries: Suren Perera, Head of Marketing & Company Spokesman Office – 2310028, Mobile – 0773 457 959**

ආයෝජන ආදායම ලාභයද ඇතුළත්ව රුපියල් මිලියන 4,707 දක්වා සියයට 6.8 කින් වර්ධනය වූ අතර ඒ සඳහා ප්‍රධාන වශයෙන් ඉවහල් වූයේ කොටස් සුරැකුම් හි වෙළඳපළ වටිනාකම් ඉහළ යාමයි.